**අධ්‍යාපන ආංශික සංවර්ධන ව්‍යාපෘතියේ (ඊඑස්ඩීපී) - මධ්‍යම මට්ටම**

---------------------------------------------------------------------

1. **මතය**

------

**මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ** 3 **ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැරුණු විට, මාගේ මතය වනුයේ,**

(අ) 2011 **ඔක්තෝබර්** 31 **දිනෙන් අවසන් මාස දහයක කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා** 2011 **ඔක්තෝබර්** 31 **දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,**

(ආ) **සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,**

(ඇ) 2011 **ඔක්තෝබර්** 31 **දිනෙන් අවසන් මාස දහයක කාලපරිච්ඡේදය තුළ විශේෂ (ඩොලර්) ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බවසහ** 2011 **ඔක්තෝබර්** 31 **දිනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙසසසඳා තිබුණු බව,**

(ඇ) **ප්‍රදාන/ණය ගිවිසුම්වල නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,**

(ඉ) **මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ**

(ඊ) **ප්‍රදාන / ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.**

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

------------------------------

2007 අගෝස්තු 07 දිනැති අංක එම්ඕඑෆ්/ඊආර්ඩී/2007/2 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛයට අනුව එක් එක් වර්ෂයේ මාර්තු 31 දින හෝ ඊට පෙර ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද, සමාලෝචිත කාලපරිච්ඡේදය සඳහා වූ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන 2012 මැයි 31 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 2.2 මූල්‍ය කාර්ය සාධනය

-------------------------

අරමුදල් ප්‍රභවයන් සහ යෙදවුම් ප්‍රකාශය සහ ලබාගත හැකි වූ තොරතුරු අනුව, 2011 ඔක්තෝබර් 31 දිනෙන් අවසන් මාස 10 ක කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘති වියදම රු.26,496,647,000 ක් වූ අතර 2011 ඔක්තෝබර් 31 දිනට සමුච්චිත වියදම රු.166,964,000,000 ක් විය. සමාලෝචිත මාස දහයක කාලපරිච්ඡේදය සඳහා වියදම හා ඉකුත් වර්ෂය සඳහා වියදම සහ 2011 ඔක්තෝබර් 31 දිනට සමුච්චිත වියදම් පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| වර්ගය | 2011 ඔක්තෝබර් 31 දිනෙන් අවසන් මාස10 ක කාලපරිච්ඡේදය | 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | 2011 ඔක්තෝබර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2011 | 2010 | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| <u>ජා.සං.සං.සහභාගිත්වය</u> | | | |
| <u>ප්‍රාග්ධන වියදම්</u> | | | |
| සංවර්ධන ක්‍රියාකාරකම් | 252 | 403 | 1,499 |
| තක්සේරු කිරීම් සහ ඇගයීම් | 16 | 135 | 323 |
| අධ්‍යාපනික ප්‍රකාශන | 8 | 28 | 68 |
| මුදල් අමාත්‍යාංශය - ව්‍යාපෘති වියදම් | 3 | 7 | 27 |

| | | | |
|---|---|---|---|
| **ජා.සං.සං. නොවන සහභාගිත්වය** | | | |
| **(සුදුසුකම්ලත් වියදම්)** | | | |
| **ප්‍රාග්ධන වියදම්** | | | |
| සංවර්ධන ක්‍රියාකාරකම් | 56 | 65 | 797 |
| තක්සේරු කිරීම් සහ ඇගයීම් | 930 | 991 | 9,034 |
| අධ්‍යාපනික ප්‍රකාශන | 10 | 16 | 53 |
| මුදල් අමාත්‍යාංශය - ව්‍යාපෘති වියදම් | 1 | 30 | 860 |
| **පුනරාවර්තන වියදම්** | | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් | 269 | 529 | 1,336 |
| සංවර්ධන ක්‍රියාකාරකම් | 3,846 | 5,105 | 30,600 |
| තක්සේරු කිරීම් සහ ඇගයීම් | 1,294 | 1,415 | 7,057 |
| අධ්‍යාපනික ප්‍රකාශන | 2 | 2 | 11 |
| **ජා.සං.සං.නොවන සහභාගිත්වය** | | | |
| **(සුදුසුකම් නොලත් වියදම්)** | | | |
| පුද්ගලික පඩිනඩි | 14,705 | 16,318 | 79,676 |
| පාසල් නිල ඇඳුම් | 1,101 | 949 | 5,910 |
| සාමූහික නොවන ආධාරකරුවන් | 1,764 | 2,606 | 11,033 |
| වෙනත් භාණ්ඩාගාර ලෙජර් ගිණුම් | 2,239 | 3,923 | 17,186 |
| උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | | - | 1,494 |
| | ---------- | ----------- | ---------- |
| | 26,496 | 32,522 | 166,964 |
| | ===== | ====== | ====== |

වර්ෂ 5 ක කාලපරිච්ඡේදය තුළ අධ්‍යාපන ආංශික සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ජා.සං.සං.මගින් දරන ලද රු.මිලියන 1,917සහ ඒකාබද්ධ අරමුදලින් දරන ලද රු.මිලියන 165,047 ඇතුළත්ව 2011 ඔක්තෝබර් 31 දිනට සමුච්චිත වියදම රු.මිලියන 166,964 ක් විය.

## 2.3 අරමුදල් ප්‍රභවයන් හා යෙදවුම් ප්‍රකාශය

----------------------------------------

**මූල්‍ය ප්‍රකාශන සහ ලබාගත හැකි තොරතුරු වලට අනුවසමාලෝචිත කාලපරිච්ඡේදය තුළදී ව්‍යාපෘතියේ අරමුදල් ප්‍රභවයන් හා යෙදවීම් පහත දැක්වේ.**

| | 2011 ඔක්තෝබර් 31 දිනෙන් අවසන් මාස10ක කාලපරිච්ඡේදය | |
|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන |
| <u>අරමුදල් ප්‍රභවයන්</u> | | |
| ජා.ස.ස - ප්‍රදාන | 133 | |
| - ණය | 146 | |
| ඒකාබද්ධ අරමුදල | 26,802 | |
| උප එකතුව | --------- | 27,081 |
| <u>අරමුදල් යෙදවීම</u> | | |
| ජා.සං.සං. සහභාගිත්ව ප්‍රාග්ධන වියදම | 279 | |
| ජා.සං.සං.නොවන සහභාගිත්වය (සුදුසුකම්ලත් වියදම්) | | |
| ප්‍රාග්ධන වියදම් | 998 | |
| පුනරාවර්තන වියදම් | 5,410 | |
| ජා.සං.සං.නොවන සහභාගිත්වය (සුදුසුකම් නොලත් වියදම්) | 19,809 | 26,496 |
| අතිරික්ත අරමුදල් | | 585 |
| | | ====== |

2.4 විශේෂ (ඩොලර්) ගිණුම (උප ලෙජර අංක - එස්එල්122)

-----------------------------------------------------------

ව්‍යාපෘතිය විසන් පවත්වන ලද පොත්පත් හා වාර්තා සහ ලබාගත හැකි වූ තොරතුරු අනුව2011 ඔක්තෝබර් 31 දිනෙන් අවසන් මාස දහයක කාලපරිච්ඡේදය සඳහා විශේෂ (ඩොලර්) ගිණුමේ මෙහෙයුම් සාරාංශ කර පහත දක්වේ.

| ලැබීම් | එ.ජ. ඩොලර් | රු. |
|---|---|---|
| ------- | --------------------- | -------- |
| 2011 ජනවාරි 01 දිනට ශේෂය | - | - |
| එකතු කළා : - ඌනපූරණයන් | | |
| - ප්‍රදාන | 726,744 | 80,671,273 |
| - ණය | 753,997 | 83,696,456 |
| අඩු කළා :- ආපසු ගැනීම් | ------------ | -------------- |
| | 1,480,741 | 164,367,729 |
| | 1,480,741 | 164,367,729 |
| 2011 ඔක්තෝබර් 31 දිනට ශේෂය | ------------- | -------------- |
| | නැත | නැත |
| | ======== | ======== |

3. විගණන නිරීක්ෂණ

---------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) <u>පිටිපන පෙළපොත් ගබඩා සංකීර්ණය ඉදිකිරීම - II අදියර</u>

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට අයත් පිටිපන පෙළපොත් ගබඩා සංකීර්ණයේ II අදියරෙහි ඉදිකිරීම් කටයුතු සඳහා රු.25,700,000 ක ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණි. උක්ත ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් මිල ගණන් කැඳවීම් සඳහා 2010 අගෝස්තු 30 දින ජාතික පුවත්පත්වල දැන්වීම් පලකර තිබුණි. ඒ අනුව අවම මිල ඉදිරිපත් කරන ලද කොන්ත්‍රාත් සමාගමට අදාල කාර්යය පවරා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ගිවිසුම් ප්‍රකාරව මෙම ඉදිකිරීම් කටයුතු 2011 ජුනි 30 දින අවසන් කළ යුතු වුවද අවස්ථා 05 කදී දින දීර්ඝ කිරීම් සිදුකර තිබුණි. අවසන් වරට එකඟ වූ දිනය අනුව 2012 මාර්තු 08 දින ඉදිකිරීම් කටයුතු අවසන් කළ යුතු වේ. කෙසේ වුවද 2012 ජුනි 15 දින වනවිටත් අදාල ඉදිකිරීම් කටයුතු අවසන් කර ගොඩනැගිල්ල භාරදීමට කටයුතු කර නොතිබුණි.

(ii) ගොඩනැගිල්ලේ කොන්ක්‍රීට් තට්ටුවවර්ග අඩි 4554 කින් සමන්විත වන අතර අවස්ථා දෙකකදී තට්ටුව නිමකර කොන්ක්‍රීට් ඇතිරීමට අදාල ඉදිකිරීම් ආයතනයට අනුමැතිය ලබාදී තිබුණි.

(iii) ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් 2010 වර්ෂයේදී භාණ්ඩාගාර පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කරන ලද රු.25,417,690 ක මුදලින් ඉදිකිරීම් හා පරිපාලන කාර්යයන් සඳහා රු.9,629,513 ක මුදලින් සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ වැය කර තිබුණි.

(iv) ගිවිසුම් ප්‍රකාරව මෙම ගබඩා ඉදිකිරීම් සිදුකර ගැනීමට හැකියාව තිබුණේ නම් ඩීන්ස් පාරේ පෞද්ගලික අංශයෙන් කුළියට ගෙන ඇති පොත් ගබඩාව වෙනුවෙන් ගබඩා කුලී වියදම් ලෙස ගෙවන ලද රු.මිලියන 4.6 ක් ඉතිරි කර ගැනීමට හැකියාව තිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ආ) <u>විද්‍යා මධ්‍යස්ථානය සඳහා නේවාසික පහසුකම් සැපයීම</u>

ඉබ්බාගමුව විද්‍යා මධ්‍යස්ථානයට අවශ්‍ය නේවාසික පහසුකම් සැපයීම සඳහා ඉබ්බාගමුව මධ්‍ය මහා විද්‍යාලයේ බාලක නේවාසිකාගාරය අළුත්වැඩියා කිරීමට රු.3,505,697 ක් ගෙවා තිබුණද, නේවාසිකාගාරය අරමුණු කළ කාර්යයන් සඳහා යොදා ගැනීමෙන් තොරව පැවතුණු බව නිරීක්ෂණය විය.

**(ඇ)** <u>**කාර්යය සාධනය**</u>

2006 සිට 2011 දක්වා අධ්‍යාපන ආංශික ප්‍රවර්ධනය සඳහා ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ අරමුදල් රු.1,916,816,448 ක් ව්‍යාපෘතිය විසින් වැයකර තිබුණු අතර, එම කාලපරිච්ඡේදය තුළ අධ්‍යාපන ආංශික සංවර්ධනය සඳහා ඒකාබද්ධ අරමුදල් රු.148,983,578,947 ක් වැයකර තිබුණි.

## 4. **පද්ධති හා පාලන**

-------------------

**පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.**

(අ) **ගිණුම්කරණය**

(ආ) **ගිණුම් වාර්තා පවත්වාගෙන යාම**

(ඇ) **අභ්‍යන්තර විගණනය**

(ඈ) **කොන්ත්‍රාත් කළමනාකරණය**